කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

බාහිර විභාග අංශය

වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය

ව්‍යාපාර කළමනාකරණවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2010

2012 ජනවාරි

# BMGT E 1015- කළමනාකරණ මූලධර්ම

ප්‍රශ්න සංඛ්‍යාව : 06

| විභාග අංකය- |
|---|

කාලය : පැය 03 යි

උපදෙස්

- ඔබ විසින් පළමු සහ දෙවන කොටස්වල දැක්වෙන සියලුම ප්‍රශ්න වලටත්, තෙවන කොටසේ සඳහන් ප්‍රශ්න අතුරින් තෝරාගත් ඕනෑම ප්‍රශ්න දෙකකටත් (02) ලෙස ප්‍රශ්න තෝරාගත යුතුය.
- පළමු කොටස සඳහා වන පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයෙහිම සටහන් කර දෙවන සහ තෙවන කොටසට අදාල පිළිතුරු පත්‍රය සමඟ ආපසු භාරදිය යුතුය.

## I කොටස

(01)

(01) විද්‍යාත්මක කළමනාකරණයේ වැදගත් දායකයින් වනුයේ;

අ) එෆ්. ඩබ්ලිව් ටෙලර් සහ හෙන්රි ෆෙයෝල්

ආ) මැක්ස් වෙබර් සහ හෙන්රි ෆෙයොල්

ඇ) එෆ්. ඩබ්ලිව් ටේලර් සහ එල්. ගිල්බර්ත්

ඈ) මැක්ස් වෙබර් සහ එෆ් ඩබ්ලිව් ටෙලර්

(02) ශ්‍රිතිය කළමනාකරුවන් වගකීමට බැඳෙනුයේ;

අ) ක්‍රියාකාරකම්වල එක් ක්ෂේත්‍රයක් සඳහා

ආ) ඉහළ මට්ටමේ කළමනාකරුවන් සහ කාර්යමණ්ඩලය වෙනුවෙන්

ඇ) ආයතනයේ සංකීර්ණ අනු-ඒකකයන් සඳහා

ඈ) තමා යටතේ සිටින්නන් වෙනුවෙන්

(03) සංවිධානයක ප්‍රධාන ලක්ෂණයන් වනුයේ;

අ) මිනිසුන්, ව්‍යුහය, අභිමතාර්ථය

ආ) මිනිසුන්, තාක්ෂණය, ක්‍රියාමාර්ග

ඇ) මිනිසුන්, ව්‍යුහය, ක්‍රියාමාර්ග

ඈ) මිනිසුන්, තාක්ෂණය, අභිමතාර්ථ

(04) කළමනාකරුවකුගේ තෙවැදෑරුම් තීරණ ගැනීමේ භූමිකාවන් වනුයේ;

අ) නායකයා, උපදේශකයා, නියෝජිතයා

ආ) ව්‍යවසායකයා, කැළඹීම් හසුරුවන්නා, සාකච්ඡා කරන්නා

ඇ) ව්‍යවසායකයා, නායකයා, සාකච්ඡා කරන්නා

ඈ) නායකයා, උපදේශකයා, කැළඹීම් හසුරුවන්නා

(05) සංවිධානයක සාමාජිකයින් නිවැරදි ඉසව්ව කරා යොමු කිරීමේදී, කළමනාකරුවකු තුළින් පෙන්නුම් කරනුයේ;

අ) විමර්ශනශීලී චර්යාව

ආ) ඒකාධිපතිවාදී චර්යාව

ඇ) නායකත්ව - සාමාජික චර්යාව

ඈ) නායකත්ව චර්යාව

(06) ආයතනික ප්‍රතිපත්ති නිර්වචනය කරනුයේ;

අ) තීරණ ගැනීමේ මාර්ගෝපදේශය ලෙසය

ආ) අභිනය සැලසුම ලෙසයි.

ඇ) උපායන් සඳහා වන ආදේශන ලෙසයි

ඈ) කළමනාකරණ අධිකාරියෙහි වන ආදේශන ලෙසයි.

(07) පුළුල් සංකල්පයක් ලෙස උපායශීලී සැලසුම්කරණයෙහි අඩංගු වනුයේ;

අ) සංයුක්ත මූලෝපායන් සහ ව්‍යාපාර මූලෝපායන්

ආ) මූලෝපායන් නිර්මාණය කිරීම සහ මූලෝපායන් ක්‍රියාත්මක කිරීම

ඇ) යෙදවුම් සහ නිමවුම්

ඈ) පාරිසරික විශ්ලේෂණය සහ අභ්‍යන්තර විශ්ලේෂණය

(08) හර්ස්බර්ග්ගේ න්‍යායට අනුව පහත ඒවායින් කුමන සාධකය රඳවාගැනීමේ සාධකයක් වන්නේද;

අ) වැටුප

ආ) කැපවීම

ඇ) වගකීම්

ඈ) පිළිගැනීම

(09) සන්නිවේදන ක්‍රියාවලිය ආරම්භ වනුයේ;

අ) කේතිකරණය මගින්

ආ) අදහස් උත්පාදනය මඟින්

ඇ) විකේතිකරණය මඟින්

ඈ) නාලිකාව තෝරාගැනීම මගින්

(10) රැකියාවකට අවශ්‍යය නිපුනතාවයන් සහ සුදුසුකම් හඳුනාගැනීම සඳහා තෝරාගැනීමේ/ බඳවාගැනීමේ ක්‍රියාවලියේදී භාවිතා කරනුයේ පහත ඒවායින්;

අ) පුද්ගල පිරිවිතරය

ආ) රැකියා අයඳුම්පත

ඇ) රැකියා විස්තරය

ඈ) සේවකයාගේ සම්බන්ධතාවයන්

(11) 2018 වසරේදී පොදු රාජ්‍ය මණ්ඩලීය රටවල ක්‍රීඩා උළෙල පැවැත්වීමට යෝජනා වී ඇති රට වනුයේ;

අ) ශ්‍රී ලංකාව

ආ) ඉන්දියාව

ඇ) ඕස්ට්‍රේලියාව

ඈ) ඇමරිකාව

(12) ඇපල් සමාගමෙහි නිර්මාතෘ වූයේ;

අ) ජෝජ් බුෂ්

ආ) ලැරී පේජ්

ඇ) ස්ටිව් ජොබ්ස්

ඈ) බිල් ගේට්ස්

(මුළු ලකුණු 12 යි)

(13) "කළමනාකරණය" යන යෙදුම නිර්වචනය කරන්න.

....................................................................................................

....................................................................................................

....................................................................................................

....................................................................................................

(ලකුණු 02)

(14) ඔබ අවිධිමත් කණ්ඩායම් ලෙස අදහස් කරනුයේ කුමක්ද?

....................................................................................................

....................................................................................................

....................................................................................................

....................................................................................................

(ලකුණු 02)

(15) නායකයා කළමනාකරුවාගෙන් වෙනස් වන්නේ කෙසේද?

....................................................................................................

....................................................................................................

....................................................................................................

....................................................................................................

(ලකුණු 02)

(16) නායකයකුගේ පස්වැදෑරුම බල මූලයන් ලියා දක්වන්න.

....................................................................................................

....................................................................................................

....................................................................................................

....................................................................................................

....................................................................................................

(ලකුණු 02)

(17) අන්තර්-පුද්ගල සන්නිවේදන ක්‍රියාවලියෙහි දක්වෙන සංරචක ලියා දක්වන්න.

.......................................................................................................

.......................................................................................................

.......................................................................................................

.......................................................................................................

.......................................................................................................

(ලකුණු 02)

(18) යාන්ත්‍රික සංවිධාන, ජෛන්ද්‍රිය සංවිධානවලින් වෙනස් වන්නේ කෙසේද?

.......................................................................................................

.......................................................................................................

.......................................................................................................

.......................................................................................................

.......................................................................................................

(ලකුණු 02)

(19) වැඩ විශේෂීකරණය යනුවෙන් හඳුන්වනුයේ කුමක්ද?

.......................................................................................................

.......................................................................................................

.......................................................................................................

.......................................................................................................

(ලකුණු 02)

(20) සංවිධානයක දැකිය හැකි සැලසුම්වල ප්‍රධාන ආකාරයන් දෙක වනුයේ;

.......................................................................................................

.......................................................................................................

(ලකුණු 02)

(21) උපායශීලී කළමනාකරණය ලෙස අදහස් කරනුයේ;

.......................................................................................................

.......................................................................................................

.......................................................................................................

(ලකුණු 02)
(මුළු ලකුණු 18)

## II කොටස

(01) ස්වේත යනු ශ්‍රී ලංකාවේ නව විලාසිතා අනුව ඇඟළුම් නිෂ්පාදනයේ පුරෝගාමී සහ කීර්තිමත් ආයතනයක් වේ. ස්වේත ආයතනයේ හිමිකාරිණිය වන ලලනි වසර පහක පමණ කාලයක සිට මෙහි ප්‍රධාන විධායක නිලධාරිනිය ලෙස කටයුතු කරයි. ඇය නිරන්තරයෙන් නවතම විලාසිතා අනුව ඇඟළුම් නිෂ්පාදනයට මෙන්ම එහි ගුණත්වයෙන් යුතු නිමාව පිළිබඳවද සැලකිලිමත් වේ.

මෙම ආයතනය නව තාක්ෂණය පිළිබඳව මේ තාක් දුරට එතරම් සැලකිලිමත් වී නැති අතරම දැනට සිටින බොහෝ පැරණි සේවකයින්ටද නව තාක්ෂණය සමඟ කටයුතු කිරීමට එතරම් පළපුරුද්දක්, හැකියාවක් නැත.

ලලනිගේ දියණිය වන උමයංගා කළමනාකාරිණියක ලෙස මෙම ව්‍යාපාරයට සම්බන්ධ වන්නේ මෑතකදී වන අතර ඇයට වසර 02 ක විලාසිතා සැකසුම පිළිබඳ උපාධියක් හිමිය. උමයංගා නිතරම ආයතනයේ තීරණ ගැනීම් පිළිබඳව ලලනි සමඟ සාකච්ඡා කරන අතර ඇය පහත අදහස් ලලනිට ඉදිරිපත් කරයි.

- ඇඟළුම් සඳහා නව විලාසිතා සැකසීමට පරිගණක තාක්ෂණය යොදා ගත යුතු බව.
- නව නිෂ්පාදන යන්ත්‍රෝපකරණ ආයතනයට මිලදී ගත යුතු බවත් ඒවා පරිගණක තාක්ෂණය සමඟ සම්බන්ධ කොට නිෂ්පාදන පිරිවැය අවම කළ යුතු බව.
- වසර දහයකට වඩා වැඩි සේවා කාලයක් ඇති සේවකයින් සඳහා ස්වේච්ඡා විශ්‍රාම ක්‍රමයක් ලබාදී; විශ්‍රාම යවා නව සේවකයන් බඳවා ගත යුතු බව.
- සියලුම විලාසිතා ප්‍රදර්ශනාගාර නව මුහුණුවරක් අනුව ස්ථානගත කළ යුතු බව.

(අ) ඔබ ලලනි නම් උමයංගාගේ අදහස් අනුව ආයතනයේ වෙනස්කම් සිදුකරන්නේද? හේතු දක්වන්න.

(ලකුණු 08)

(ආ) ආයතනික වෙනස්කම් සිදුකරන්නේ කෙසේද යන්න පිළිබඳ සැලසුමක් සකස් කරන්න.

(ලකුණු 12)

(මුළු ලකුණු 20)

## III කොටස

(01) (අ) ඵලදායිතාවය සහ රැකියා තෘප්තිය (Productivity and Job Satisfaction) අතර ඇති සබඳතාවය උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

(ලකුණු 06)

(ආ) සමූහ තීරණ ගැනීමේදී ඇති වන වාසි-අවාසි මොනවාද?

(ලකුණු 06)

(ඇ) මට්ටම් පහකින් යුතු මැස්ලෝගේ ධූරාවලිය උදාහරණ සහිතව විස්තර කරන්න.

(ලකුණු 06)

(ඈ) සුළනි පෞද්ගලික ආයතනයක මානව සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ විධායක නිලධාරිනයක ලෙස සේවය කරයි. ඇයට ආයතනය සැළකිය යුතු මට්ටමේ වැටුපක් ගෙවන අතරම අමතර දීමනාද ඇයට හිමිය. ඇයගේ ප්‍රධානියා වන්නේ අධ්‍යාපන සුදුසුකම් ප්‍රමාණවත් මට්ටමකට සපුරා නොමැති වුවද රැකියා පළපුරුද්ද මත උසස්වීම් ලැබුවකු වන ලෝචනය. ලෝචන උපාධිධාරීන් නොරුස්සන අතරම ඔවුන්ගේ අදහස් පිළිබඳවද එතරම් තැකීමක් නොකරයි. ඔහුගේ හිතවත්කම් මත ප්‍රමාණවත් සුදුසුකම් නොමැතිව ආයතනයට සම්බන්ධ වී සිටින සේවකයන්ගේ අදහස් ඔහු ඉතා ඉහළින් පිළිගනියි. මානව සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ වැඩෙහි නිරත සුරනි, ලෝචනගේ හිතවතියකි. සුරනිගේ අදහස් බොහෝවිට ක්‍රියාවට නැංවෙන අතර මේ පිළිබඳව සුළනිට ඇත්තේ දැඩි කළකිරීමකි.

(a) සුළනිගේ අවප්‍රේරණ තත්ත්වයට හේතු වන්නේ කුමක්ද?

(ලකුණු 02)

(b) ඔබ සමස්ත ආයතන ජාලයෙහිම මානව සම්පත් කළමනාකරු ලෙස මෙම තත්ත්වය පිළිබඳව දැනුවත් නම් සුළනිගේ අවප්‍රේරණය තත්ත්වයට දිය හැකි විසඳුම් යෝජනා කරන්න.

(ලකුණු 05)

(මුළු ලකුණු 25)

(02) (අ) අරමුණු (Goals) සැලසුම් (Plans) වලින් වෙනස් වන්නේ කෙසේද?

(ලකුණු 04)

(ආ) "එකිනෙක කළමනාකරන මට්ටම අනුව සැලසුම්කරණය වෙනස් විය හැක." කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 06)

(ඇ) "අවදානම් සහගත පාරිසරික තත්ත්වයන් සැලසුම්කරණයට බලපෑම් කරයි." ඔබ ඉහත ප්‍රකාශය සමඟ එකඟවන්නේද? පහදන්න.

(ලකුණු 07)

(ඈ) ඉකෝ යනු දැනට ශ්‍රී ලංකාවේ පවතින; පොල් ලෙලි පරිවර්තන ක්‍රියාවලියකට භාජනය කොට අමුද්‍රව්‍යයක් ලෙස විදේශ රටවලට අපනයනය කරන සමාගමකි. මොවුන් සැලකිය යුතු මිලක් ගෙවා දේශීය සැපයුම්කරුවන්ගෙන් පොල් ලෙලි මිලදී ගෙන අපනයන කටයුතු කරගෙන යයි. මෑතක සිට ඉල්ලුමට සරිලන ලෙස පොල් ලෙලි දේශීය සැපයුම්කරුවන්ගෙන් ලබාගැනීම ගැටළුවක්ව පවතින අතර පොල් ලෙල්ලක් සඳහා ඉහළ මිලක්ද දේශීය සැපයුම්කරුවන් බලාපොරොත්තු වේ. මෙම ගැටළුව සම්බන්ධව සාකච්ඡා කිරීමට ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරී විසින් රැස්වීමක් සංවිධානය කර තිබූ අතර එහිදී තීරණ දෙකක් පිළිබඳව සලකා බලන ලදී. එක් තීරණයක් වූයේ අසල්වැසි විදේශ රටවලින් පොල් ලෙලි අඩු මිලට ලබාගෙන එය පරිවර්තන ක්‍රියාවලියට භාජනය කොට දැනට පවතින මිලට වඩා වැඩි මිලකට අපනයනය කිරීම වාසිදායක බවයි. අනෙක් තීරණය වූයේ දේශීය සැපයුම්කරුවන් බලාපොරොත්තු වන මිලට ආසන්න මිලක් ගෙවා පොල් ලෙලි මිලට ගෙන දැනට පවතින මිලට ආසන්න වාසිදායක මිලකට අපනයන කටයුතු කල යුතු බවත්ය.

(අ) ඔබ මෙම ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරී යැයි සිතා ඔබ කුමන තීරණය සලකා බලන්නේදැයි තීරණ ගැනීමේ ක්‍රියාවලිය ආශ්‍රය කරගෙන පැහැදිලි කරන්න.

(ලකුණු 08)

(මුළු ලකුණු 25)

(03) පහත සඳහන් මාතෘකා අතුරින් ඕනෑම දෙකක් (02) පිළිබඳවවිස්තර කරන්න.

(අ) කළමනාකරණ දැල (Management Gried)

(ආ) භවාත්මක ඥානය (Emotional Intelligence)

(ඇ) සමූහ සංවර්ධනයේ පියවර (Stages of Group Development)

(ඈ) සංවිධානමය සන්නිවේදනය

(12.5 x 2 = 25)